**මැදිරිගිරිය ප්‍රාදේශීය සභාව - 2023**
**------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

මැදිරිගිරිය ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම්/ ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්ති වලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට මැදිගිරිය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

*මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.*

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | යුධගනාව සුසාන භූමියේ ඉඩමේ වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. | තක්සේරු කර 2024 වර්ෂයේ ගිණුම තුළ ඇතුළත් කිරීමට කටයුතු කරන බව දක්වා ඇත. | වත්කම් පවරාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | ඉකුත් වර්ෂයට අදාළව සමාලෝචිත වර්ෂයේදී ලැබී තිබුණු රු.137,000 ක් වූ දැන්වීම් පුවරු ආදායම්, සමාලෝචිත වර්ෂයේ ආදායම් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් වර්ෂයේ අතිරික්තය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි. | වර්ෂයට අදාළ ආදායම් එම වර්ෂයේම ඇතුළත් කිරීමට කටයුතු කරන බව දක්වා ඇත. | උපචිත පදනම අනුව ගිණුම් ඉදිරිපත් කළ යුතුය. |
| (ඇ) | සභාවට ලැබී තිබුණු වටිනාකම රු.220,000 ක් වූ සහල් පිටි කිරීමේ මෝටර් 02 ක් 2015 වර්ෂයේදී සොරාගෙන ගොස් තිබුණු නමුත්, එම වටිනාකම ස්ථාවර වත්කම් යටතේ දක්වා තිබුණි. | අදාළ වටිනාකම ස්ථාවර වත්කම් වලින් ඉවත් කර හානි පාඩු ලේඛනය තුළ ඇතුළත් කිරීමට කටයුතු කරන බව දන්වා ඇත. | නිවැරදිව ගිණුම් ඉදිරිපත් කළ යුතුය. |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ ජූනි මස සිට දෙසැම්බර් මස දක්වා විනෝද බදු සඳහා අයවීම් රු.401,500 ක් විවිධ තැන්පතු යටතේ ගිණුම්ගත කිරීම හේතුවෙන් වර්ෂයේ විනෝද බදු ආදායම එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | රු.401,500 වූ විනෝද බදු ආදායම පරික්ෂා කර ආදායමට ගැනීමට කටයුතු කරන බව දන්වා ඇත. | නිවැරදිව ගිණුම් ඉදිරිපත් කළ යුතුය. |

### 1.6.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විෂය | මුදල | නොසැපයූ විගණන සාක්ෂි | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| | රු. | | | |
| කර්මාන්ත ණය හිමි | 8,645,396 | I.ශේෂ සනාථ කිරීම් | කර්මාන්ත ණයගැති, ණයහිමි ශේෂ සනාථ ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව දක්වා ඇත. | අවශ්‍ය සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. |
| කර්මාන්ත ණය ගැති | 7,911,690 | II.ණයගැති, ණය හිමි සැසඳීම් | | |

## 1.7 අනුකූල නොවීම්

### 1.7.1 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1980 අංක 46 දරන සේවක භාරකාර අරමුදල් පනත | 2019 දෙසැම්බර් මස සිට 2023 දෙසැම්බර් මස දක්වා කාලය තුළ සභාවේ අනියම් කාර්යය මණ්ඩලයේ මාසික වැටුප මත සේවක භාරකාර අරමුදල වෙත ගෙවිය යුතු රු.216,877 ක් වටිනා සභාවේ දායක මුදල් ගෙවීම් කර නොතිබුණි. | ගෙවීමට කටයුතු කරන බව දන්වා ඇත. | නීති උපදෙස් අනුව කටයුතු කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය<br>---------------<br>XXIV පරිච්ඡේදයේ 3.6 ඡේදය | සමාලෝචිත වර්ෂයේදී නිලධාරීන් 07 දෙනෙකු සඳහා නිකුත් කර තිබුණු රු.1,126,768 ක් වටිනා වැටුප් ණය අත්තිකාරම් සඳහා ණය ආපසු අය කිරීමේදී මාසික වාරික මුදල මූලික වැටුපෙන් සියයට 10 ක් වන පරිදි තීරණය කර නොතිබුණි. | 2024 ජනවාරි මස සිට නිවැරදි කර ඇති බව දන්වා ඇත. | වාරික අයකිරීමට අදාළ උපදෙස් අනුව කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2019 නොවැම්බර් 19 දිනැති අංක 2019/14 දරන උතුරු මැද පළාත් භාණ්ඩාගාර චක්‍රලේඛය<br>-----------------<br>04 ඡේදය | 2023 දෙසැම්බර් 31 දිනට අදාළ භාණ්ඩ සමීක්ෂණ කටයුතු අවසන් කර 2024 පෙබරවාරි 15 දිනට පෙර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, එලෙස කටයුතු කර නොතිබුණි. | සමීක්ෂණ වාර්තාව ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව දන්වා ඇත. | නියමිත පරිදි සමීක්ෂණ සිදුකර වාර්තා ඉදිරිපත් කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ වියදම ඉක්මවූ අයභාරය රු.32,211,799 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ වියදම ඉක්ම වූ අයභාරය රු.11,579,674 ක් විය.

### 2.3 ආදායම් පරිපාලනය

### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

ලේකම් විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 4,993,116 | 4,382,673 | 4,457,112 | 5,997,764 | 3,384,810 | 5,117,490 | 4,009,761 | 6,072,203 |
| (ii) | කුලී | 15,858,300. | 7,618,446 | 10,882,609 | 823,259 | 12,382,800 | 7,231,911 | 6,446,113 | 4,087,422 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 309,800 | 531,960 | 531,960 | | 357,250 | 203,784 | 211,784 | - |
| (iv) | වෙනත් ආදායම් | 3,127,200 | 4,835,294 | 4,785,398 | 574,769 | 3,205,000 | 1,742,159 | 1,742,159 | 524,873 |
| | | 24,288,416 | 17,368,373 | 20,657,079 | 7,395,792 | 19,329,860 | 14,295,344 | 12,409,817 | 10,684,498 |

### 2.3.2 ආදායම් රැස්කිරීමේ කායර්සාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **වරිපනම් හා බදු**<br>දීර්ඝ කාලයක සිට මූල්‍ය ප්‍රකාශන වල ඉදිරියට ගෙන එන වරිපනම් බදු ආදායම් හිඟය සමාලෝචිත වර්ෂය අවසානයේදී රු.5,997,764 ක් වී තිබුණු නමුත් හිඟ ආදායම නිරවුල් කරගැනීම සඳහා කටයුතු කර නොතිබුණි. | වැඩිපුර හිඟහිටි වරිපනම් හිමියන් හඳුනාගෙන රතු නිවේදන භාරදී එම මුදල් අයකර ගැනීමට කටයුතු කර ඇති බව දන්වා ඇත. | හිඟ ආදායම කඩිනමින් අයකර ගත යුතුය |

| | | | |
|---|---|---|---|
| **(ආ)** | **කුලී** | | |
| | මස්කඩ, මාළු ලැලි, රථගාල්, සතිපොළ වලට අදාළ වර්ෂ ගණනාවක සිට හිඟව පවතින රු.371,455 ක ශේෂය සමාලෝචිත වර්ෂය තුළදීද නිරවුල් කර නොතිබුණි. | කපාහැරීමට යවන ලද නමුත් මේ වන තෙක් අනුමැතියක් ලැබී නොමැති බවත්, හිඟ ආදායම් සම්බන්ධයෙන් මේ වන විට සහකාර කොමසාරිස් කාර්යාලය හරහා විමර්ශනයක් සිදුකරන බවත්, ඒ අනුව හිඟ ආදායම් සම්බන්ධයෙන් ගත හැකි ක්‍රියාමාර්ග කඩිනමින් ගැනීමට කටයුතු කරන බවත් දන්වා ඇත. | හිඟ ආදායම් කඩිනමින් නිරවුල් කළ යුතුය. |
| **(ඇ)** | **වෙනත් ආදායම්** | | |
| (i) | සමාලෝචිත වර්ෂයට පෙර සිට පැවත එන හිඟ හිටි ව්‍යාපාර බදු රු.2,129,560 ක් නිරවුල් කරගැනීම සඳහා අවධානය යොමුකර නොතිබුණි. | අයකරගත නොහැකි හිඟ ආදායම් සම්බන්ධයෙන් මේ වන විට සහකාර කොමසාරිස් කාර්යාලය හරහා විමර්ශනයක් කරන බවත්, ඒ අනුව හිඟ ආදායම් සම්බන්ධයෙන් ගත හැකි ක්‍රියාමාර්ග කඩිනමින් ගැනීමට කටයුතු කරන බවත් දන්වා ඇත. | හිඟ ආදායම් කඩිනමින් නිරවුල් කළ යුතුය. |
| (ii) | වර්ෂ 05 කට අධික කාලයක සිට පැවත එන හිඟ ජල ගාස්තු ආදායම රු.556,608 ක් නිරවුල් කරගැනීම සඳහා කටයුතු කර නොතිබුණි. | අයකරගත නොහැකි හිඟ ආදායම් සම්බන්ධයෙන් මේ වන විට සහකාර කොමසාරිස් කාර්යාලය හරහා විමර්ශනයක් කරන බවත්, ඒ අනුව හිඟ ආදායම් සම්බන්ධයෙන් ගත හැකි ක්‍රියාමාර්ග කඩිනමින් ගැනීමට කටයුතු කරන බවත් දන්වා ඇත. | හිඟ ආදායම් නිරවුල් කරගත යුතුය. |
| (iii) | ඉදිරිපත් කළ වාර්තා අනුව පළාත් සභාවේ ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2023 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ ආදායම රු.47,526,040 ක් සහ මුද්දර ගාස්තු ආදායම රු.5,981,330 ක් විය. | ගෙන්වා ගැනීමට කටයුතු කරන බව දන්වා ඇත. | හිඟ ආදායම් නිරවුල් කරගත යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරිම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කාර්තවයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **අතුරු ව්‍යවස්ථා**<br>ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ අතුරු ව්‍යවස්ථා පැනවිය යුතු, පානීය ජලය විකිණීම හා වාහන යන්ත්‍ර සූත්‍ර සඳහා කුලිය අයකිරීම යන ප්‍රධාන කාරණා 02 ක් ඉටුකිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි. | අතුරු ව්‍යවස්ථා පැනවීමට අවශ්‍ය කටයුතු ඉදිරියේදී සිදුකරන බව දන්වා ඇත. | අවශ්‍ය අතුරු ව්‍යවස්ථා පනවාගත යුතුය. |

## 3.2 නිෂ්කායර් හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය විසින් විධිමත් ශක්‍යතා අධ්‍යනයකින් තොරව ප්‍රාදේශීය සභාව මඟින් ක්‍රියාත්මක කරවීමට සැලසුම් කළ ග්‍රාමීය විද්‍යුත් පුස්තකාල ව්‍යාපෘතිය යටතේ විද්‍යුත් පුස්තකාල ගොඩනැගිලි 03 ක් ඉදිකිරීම සඳහා රු.11,303,033 ක් වැය කර තිබූ නමුත්, එම ගොඩනැගිලි තුළ අදාළ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය මානව හා භෞතික සම්පත් ලබාදීමට පවත්නා බඳවාගැනීම් සීමා කිරීම් නිසා සභාව අපොහොසත් වී තිබුණු බැවින් අදාළ වියදම් නිෂ්කාර්යය වී තිබුණි. | අඹගස්වැව ග්‍රාමීය විද්‍යුත් පුස්තකාලය 2023 සැප්තැම්බර් මස සිට මහජන පුස්තකාල ළමා අංශය පවත්වාගෙන යන බවත්, කළමනාකරණ කමිටු තීරණයක් මත එක් පුස්තකාලයක් තුළ වාණිජමය කටයුත්තක් සිදුකිරීමේ අරමුණින් ඉල්ලුම් කර ඇති පාර්ශවයක් වෙත ලබාදීම සඳහා අභ්‍යන්තර තක්සේරු කමිටුවක් මඟින් තක්සේරු කර ගිවිසුම්ගත වී ලබාදීමට තීරණය කරන ලද බවත් දන්වා ඇත. | ඉදිකරන ලද වත්කම් උපයෝජනය සඳහා කටයුතු කළ යුතුය. |

## 3.3 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2021 වර්ෂයේදී LDSP ව්‍යාපෘතිය යටතේ දිවා සුරැකුම් මධ්‍යස්ථානයක් ඉදිකිරීමේදී බල ප්‍රදේශයේ අවශ්‍යතාවය ඉක්මවන ප්‍රමාණයේ ගොඩනැගිල්ලක් ඉදිකිරීම නිසා සමාලෝචිත වර්ෂය අවසන් වන විට රු.35,599,552 ක් වැයකර තිබුණු නමුත්, ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම මත 2024 මාර්තු වන විටත් වැඩ අවසන් කිරීමට නොහැකිව පැවතුණි. මෙම ගොඩනැගිල්ලේ දිවා සුරැකුම් මධ්‍යස්ථානය පවත්වාගෙන යාම සඳහා රු.12,410,711 ක් වැය කර සමාලෝචිත වර්ෂයේ දී උපකරණ මිලදීගෙන තිබුණද, ඒවාද මාස 10 ක පමණ කාලයක් තිස්සේ නිෂ්කාර්යව පැවතුණි. | අනුමත වූ ප්‍රතිපාදන ප්‍රමාණය අනුව මෙහි ඉදිකිරීම් කටයුතු නිම කරගැනීමට නොහැකි වූ බවත්, 2024 සැප්තැම්බර් අවසන් වීමත් සමඟ සියළු වැඩ අවසන් කර දිවා සුරැකුම් මධ්‍යස්ථානය ආරම්භ කිරීමට බලාපොරොත්තු වන බවත් දන්වා ඇත. | ව්‍යාපෘතිය කඩිනමින් ආරම්භ කළ යුතුයි. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 53-5060 අංක දරන කැබ් රථය වසර 21 කට අධික කාලයක සිට සභා භූමියෙහි නිෂ්කාර්යව පැවතුණි. | උතුරු මැද පළාත වෙත ලබාදී ඇති ඉහත අංක දරන වාහනය මුදල් අමාත්‍යාංශයේ එකඟතාවය ගෙන ප්‍රධාන ලේකම් උතුරු මැද පළාත වෙත පවරා ගත යුතු බවත් ඒ සඳහා එම්.ටී.ඒ 6/8 ආකෘති පත්‍ර පුරවා යවන ලද බව දන්වා ඇත. | අප්‍රමාදව අපහරණය සඳහා කටයුතු කළ යුතුය. |
| (ඇ) | සභා භූමියේ වසර 11 කට අධික කාලයක සිට ජල බවුසර් 02 ක් නිෂ්කාර්යව දිරාපත් වෙමින් පැවතුණි. | වෙන්දේසි කිරීමට කටයුතු කරනු ලබන බව දන්වා ඇත. | අප්‍රමාදව අපහරණය සඳහා කටයුතු කළ යුතුය. |
| (ඈ) | 2022 මැයි මාසයේ සිට එන්ජිම අළුත්වැඩියා කළ යුතු තත්ත්වයක පවතින මෝටර් ග්‍රේඩර් යන්ත්‍රයේ අළුත්වැඩියාව සඳහා රු.467,465 ක ඇස්තමේන්තුගත පිරිවැයක් දැරීමට 2023 ජූනි 30 දින උතුරු මැද ප්‍රධාන ලේකම්ගේ අනුමැතිය ලැබී වසරක කාලයක් ගත වී තිබුණ ද, එම අලුත්වැඩියාව සිදුකර නොතිබුණි. | යාන්ත්‍රික ඉංජිනේරු නිර්දේශයන් අනුව ඉදිරි කටයුතු කිරීමට අපේක්ෂා කරන බව දන්වා ඇත. | අලුත්වැඩියා කර වත්කම් උපයෝජනය සඳහා කටයුතු කළ යුතුය. |

**3.4 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 57 ක් වූ සභාවේ අනුමත කාර්යය මණ්ඩලයෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට තථ්‍ය ස්ථිර කාර්ය මණ්ඩලය 42 ක් පමණක් වූයෙන් අනුමත කාර්යය මණ්ඩලයේ තනතුරු 09 ක පුරප්පාඩු 15 ක් පැවතුණි. | උතුරු මැද පළාත් පාලන දෙපාර්තමේන්තුවට දැනුම් දී ඇති බව දන්වා ඇත. | තනතුරු සම්පූර්ණ කර නිසි සේවය ලබා දිය යුතුය. |